

"මම "අරුන්දතී" කරන්නෙ 1999". ඉස්කෝලෙන් අයින් වුණ අළුත ම වාගේ." "සන්නස" පාඨකයින් වෙනුවෙන් අප සමග පිළිදරුකට එලෙසින් එක් වෙන්නෙ තුමිඳු දොඩම්තැන්න තරුණ නිර්මාණවේදියායි.

"ඒ කාලය දේශපාලනික වශයෙන් සංක්‍රාන්ති කාලයක්. එක්තරා විදියකට ධනපති ක්‍රමය හිස ඔසවන කාලයක්. ඉතින් මේ පාවතින ක්‍රමයට ඒ ක්‍රමයෙන් බැහැරව ඉඳන් විරුද්ධව සටන් කරන පිරිසකුයි, ඒ ක්‍රමයටම අනුගත වෙලා ක්‍රමය වෙනස් කරන්න හදන පිරිසකුයි දෙගොල්ලක් මම දකිනවා. එයින් ඉස්සරවෙලා මං කිව්ව පිරිස ක්‍රමය විසින්ම විනාශයට පත් කරනවා..." 1999 වෙනකොට ඒ විදියට විනාශ වුන විශාල තරුණ පිරිස නිසා ලොකු හිඳැසක් ඇති වෙනවා. මේ හිඳැස දකලයි මම කල්පනා කරන්නෙ දෙවන පිරිස යන පාරේ යාම නුවණට හුරුයි කියලා." "අරුන්දතී" ගේ සැලකිල්ලත් සංකල්පයත් දෙකම මා අතින් ගොඩනැගෙන්නෙ ඔය අදහස අනුවයි."

වසරේ යොවන සම්මාන 15කින් 12 ක්ම දිනාගත් " අරුන්දතී" වේදිකා නාට්‍යය සැප්තැම්බර් මාසයේ දෙවෙනිදා පස්වරු 3.30වත් 6.30වත් බර්වුඩ් ප්‍රදේශයේ කෙල්වොරිසන් ශාලාවේදී (මෙල්වේ විපරම 62 සී 5) වේදිකාගත වීමට නියමිතයි. බෙරක් ගි ශාක්‍යමුණි සම්බුද්ධ විහාරස්ථානයේ ගොඩනැගිලි අරමුදල වෙනුවෙන් ප්‍රදර්ශනය කෙරෙන "අරුන්දතී" ගි නිර්මාණකරුවා වන තුමිඳු තව දුරටත් අප හා එක් වෙමින්;

"නාට්‍යයේ සාර්ථකත්වයට හේතුව අපි හැමෝගෙම සාමූහික හැඟීම. මගේ අදහසට හැමෝගෙම එකඟත්වයක් තිබුණා. ඒ වගේම ඇඳුම්, නැටුම් නිර්මාණය කරපු ප්‍රසන්නපිත් අබේසූරිය, සිත්දු ලියපු මංජුල වෙඩිවර්ධන වගේ ක්ෂේත්‍රයේ කලින් වැඩකරලා තිබුණ අත්දැකීම් "අරුන්දතීට" ප්‍රයෝජනවත් වුණා".

"තුමිඳු කිව්වා වගේම අපි හුගදෙනෙක් ඒ දවස්වල අළුත් අය. ඊට කලින් සමහර අය සමහර නිර්මාණවලට දායක වෙලා තිබුණත් පොදුවේ ගත්තම අපි හැමෝගෙම "ටර්නින් පොයින්ට්" එකක්; නැත්තම් හැරීම් ලක්ෂයක් " අරුන්දතී". ඒ අරුන්දතී නාට්‍යයේ රංගනවේදී ජයනාත් බණ්ඩාරයි. අපේ නාට්‍යය ජීවිතවලට විතරක් නෙවෙයි; පොද්ගලික ජීවිතවලටත් වැදගත් වුණා...." ජයනාත් තරුපති දිහා බලමින් සිනාසෙයි. ගයනි ඇයගේ බාල පුතු තුරුළු කරගනියි.

මෙල්බර්න් නුවර අප හා වෙසෙන තරුපති මුණසිංහ යොවන සංගීතවේදියා "අරුන්දතී" ගි සංගීත අධ්‍යක්ෂවරයායි. තරුපතිගේ ප්‍රිය බිරිඳ ගයනි ගිසන්තිකා ලියනාරච්චි සම්මානනීය සිනමා හා වේදිකා නාට්‍ය රංගනවේදිනිය "අරුන්දතී" ගි ප්‍රධාන භූමිකාවට පණ පෙවූ ශිල්පිණියයි.

"තරු ට ගයනිව මුණගැහුනේ අරුන්දතී හින්දයි. ඇත්තටම තරුගේ සංගීතය නාට්‍යයට ලොකු ආලෝකයක් වුණා. මට ඕන කරලා තිබුණෙ යථාර්තවාදී වගේ ම සෞන්දර්යාත්මක නිර්මාණයක කරන්න. ඒකට "තරු"ගේ සංගීතය ලොකු සහයක් දුන්නා. ගයනි වුණත් කලින් රගපාලා තිබුණාට මුලින් ම සම්මාණීයත්වයට පත් වුණේ "අරුන්දතී" ගේ "පූර්ණිමා" භූමිකාවෙන්. තුමිඳු ඥානපූර්ණත්වයක් සැපයුවා.

"ඇත්තටම 'අරුන්දතී'ගෙන් පටන් අරගෙන අපි අද බොහොම දිග ගමනක් ඇවිත් තියෙනව..." "මනමේ" නාට්‍යයේ වැදි රජු, "සිංහබාහු" නාට්‍යයේ සිංහයා, " නරබෑනා" නාට්‍යයේ නරියා වැනි චරිතවලට වර්තමානයේ පණ පොවනා ජයනාත් කිව්වෙ හැඟීම් බර හඬකින්. ජයනාත් බණ්ඩාර ඔක්ස්ෆර්ඩ් කොලේජ් ඔෆ් බිස්නස් ස්ටඩීස් හි ඉංග්‍රීසි දේශකවරයෙක්. එමෙන්ම අයි.සී.බී.ටී. ශ්‍රී ලංකා ආයතනයේ සහ ටවර් හෝල් පදනමේ බාහිර දේශකවරයෙකු වශයෙන් ද කටයුතු කරනවා.

"අපි වගේ අයගේ නාට්‍ය ජීවිතයේ ලොකු පෙරළියක් කරපු නාට්‍ය "අරුන්දතී". මම රගපෑවෙ බැමිණියගෙ චරිතයට. මටත් මුල් ම සම්මානය ලැබුණෙ මේ නාට්‍යයෙන් ඉතින් ඒක ලොකු ධෛර්යයක් වුණා මට. ඒ නිසා අඳටත් මම "අරුන්දතීට" ගරු කරනවා." හෂිනිකා කරල්ලියද්දැ රංගනවේදිනිය පිළිසඳරට එක් වුණේ එලෙසින්.

"තිමිර පව්ව", "සත්පුර වැසියෝ", "සූරිය දරුවෝ" ඇතුළු ටෙලි නාට්‍ය විශාල සංඛ්‍යාවකට රංගනයෙන් දායක වුණු හෂිනිකා හොඳම නිළිය ලෙස රාජ්‍ය සම්මාන මෙන්ම යොවන සම්මානත්, කුසලතා සම්මානත් රැසක් ම ලබා ඇති ශිල්පිනියකි. "ආකාශ කුසුම්" සහ "බොරදිය පොකුණ" සිනමා පට සඳහා ද අයය රංගනයෙන් දායක වූවා. ඉන්දියාවේ පැවැත්වූ විදි නාට්‍ය උළෙලක් සඳහා ඇය ශ්‍රී ලංකාව නියෝජනය කරලා.

"අරුන්දතී" නාට්‍යයේ මට ලැබුණ චරිතයෙන් මට ගොඩක් දේවල් කරන්න පුළුවන් වුණා. තුමිඳුට අපි අඳටත් කියන්නෙ අපි මේ නාට්‍ය ලංකාවේ ආයෙත් කරමු කියලා. හෂිනිකා සිනාසුනා.

"අත්දැකීම් බොහොම අඩු කාලයක, අපේ තරුණ කාලේ කරපු නාට්‍යයක් "අරුන්දතී". ඒ නිසා අපි හැමෝටම මේ අත්දැකීම වැදගත් වුණා. ඉස්කොලෙන් අයින් වුණ ගමන් අපි වාගේ කොල්ලො කෙල්ලො ටිකක් කරපු මේ වාගේ නාට්‍යයක් මේ වාගේ තැනකට එයි කියලා හිතුනෙ නෑ." ඒ තවත් රංගනවේදියෙකු වන ධර්මප්‍රිය ඩයස් යොවනයායි. "මවා" සිනමා පටයේ රඟපෑම වෙනුවෙන් සම්මානයට පාත්‍රව වැනිස් චිත්‍රපට උළෙලත් ඩුබායි ජාත්‍යන්තර චිත්‍රපට උළෙලත් දකුණු කොරියාවේ හා යුක්රේන් වල පැවැත්වුණ උළෙලවල් වලටත් සහභාගී වුණ ධර්මප්‍රිය කැළණිය විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා සිනමාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිධරයෙ එම විෂයයන්ම ඉගැන්වීම් කරනා ගුරුවරයෙක් වශයෙන් රැකියාවේ නියැලෙන ඔහු සරසවි සිනමා උළෙලේදී හොඳම නළුවා වශයෙන් මෙන්ම රාජ්‍ය නාට්‍ය උත්සවයේදී හොඳම රංගන විනාසය වෙනුවෙන්ද සම්මාන ලැබුවා. ඒ ඔහු ලැබූ සම්මාන රැසකින් කිපයක් පමණයි.

වැඩිමල් සුරතල් පුතු අත්‍යන් හා සෙල්ලමින් පසුවන අතරේදී තමන් අත වූ කුඩා පුතු තරුපති අතට දෙමින් ගයනි ගිසන්තිකා "අරුන්දතී" වෙනුවෙන් කතාවට එක් වුණා.

"අරුන්දතී" මගේ පළවෙනි වේදිකා නාට්‍ය නෙවෙයි. ඇත්තටම මට මුලින්ම වේදිකාවට සම්බන්ධ වුණේ 1993 දී, "තිත්ත කුසලාන" වේදිකා නාට්‍යයටයි. ඊ ළඟට මම රඟපෑවේ "හන්සයින්වත් මං ආසයි" කියන වේදිකා නාට්‍යයේ. ඊට පස්සේ ටෙලි නාට්‍ය කිපයකටත් සම්බන්ධ වුණා. තුමිඳු මගේ ඒ රඟපෑම් දැකලයි " අරුන්දතී" වේදිකා නාට්‍යයට කතා කළේ. ඇත්තටම පිටපත දැක්කම හරි ආසා හිතුණා. මොකද මේ කතාව ඉන්දියානු බ්‍රාහ්මණ කුලයේත් ක්ෂුද්‍ර කුලයේත් දෙදෙනෙකු අතර බඳුන ආදර කතාවක්. දේශපාලනික වශයෙනුත් යටින් දිවෙන අරුතක් තියෙන නිසා මේ කතාව අඳටත් අදාලයි කියලා හිතනවා."

"ඒ දවස්වල මේ ක්ෂේත්‍රයේ කටයුතුවලට සම්බන්ධවෙමින් හිටපු බොහොම තරුණ පිරිසක් එකතු වෙලයි නාට්‍ය කෙරුණෙ. හිතපු නැති විදියට යොවන සම්මාන උළෙලේ අගයීමට ලක්වුණා. ඒ වගේම රාජ්‍ය නාට්‍ය උළෙලේත් හොඳම පිටපත වගේ සම්මාන ගණනාවක්ම ලැබුණා."

"ඇත්තටම මම ගෙදර දොරේ දරුවන්ගේ කටයුතු නිසා ටිකක් රඟපෑමෙන් ඈත් වෙලයි කාලයක් හිටියෙ. තරුගේ අධ්‍යාපන වැඩවලටනේ අපි මෙහෙ ආවෙ. ඒවට මූලිකව ඉඩ ලබාදෙන්නත් ඕනෑනේ. කාලයකින් රඟපෑවත් අපි දෙන්නම එකම ක්ෂේත්‍රයේ නිසා නාට්‍යය සිනමාව වගේ දේවල් ගැන අවබෝධයෙන්, හඳාරමිනුයි ඉන්නෙ. නාට්‍යයක මුලින්ම රඟපානවට වැඩිය දැන දොළොස් වතාවක් රඟපානකොටයි. හරියටම ඒ චරිතයට අනුගත වෙලා වඩාත් හොඳ රඟපෑමක් වෙන්නෙ. ඇත්තටම දැන් අපි එළාට වඩා අත්දැකීමෙන්, දැණුමෙන් මහුකුරා ගිහින්. ඒ නිසා මේ රඟපෑමෙ වඩාත් හොඳින්, පහසුවෙන් කරන්න පුළුවන් කියලා මට විශ්වාසයි."

"ඒක ඇත්ත. අපි අද කරන දේ නෙවෙයි හෙට කරන්නෙ. අඩු පාඩු තියෙනවානම් හඳාගෙන වඩාත් හොඳ දෙයකුයි ඊළඟ වතාවේ කරන්නේ. මේ නාට්‍ය කලින් බලලා තියෙන කෙනෙකුට වුණත් මේ වාරේ දකින්න ලැබෙන්නේ ඊට වඩා වැඩි දෙයක්..." හිෂිනිකාත් ගයනිගේ අදහසට එකඟ වුණා.

"ඇත්තටම මට මගේ රංගනය ගැන විශ්වාසයක් තියෙනවා. මම මුලින්ම හඳාරපු සංගීතය, නැටුම් විෂයන්ට වඩා පහසුවෙන් මට රංගනය කරගෙන යන්න පුළුවන්. තරුත් නිතරම මට ඒ වෙනුවෙන් ඉඩ කඩ ලබා දෙනවා." ගයනි සංගීත විශාරදවරියක්. ඒ වාගේම ඇය නර්තනයත් හඳාරා තිබෙනවා. ඇය "තිත්ත කුසලාන" වේදිකා නාට්‍ය සඳහා හොඳම නිළිය සම්මානය ලැබුවා. "අරුන්දතී" නාට්‍යයේ රංගනය වෙනුවෙන් ද සම්මානයෙන් පිදුම් ලැබුවා. "මගේ වම් අත" චිත්‍රපටයේ රඟපෑම සඳහා හොඳම නැගී එන නිළිය ජනාධිපති සම්මානය "අම්මා-චරයෙන්" චිත්‍රපටයේ රඟපෑම සඳහා හොඳම සහය නිළිය ලෙස ජනාධිපති හා සරසවි සම්මානත් ලබමින් ඇය සිනමා ක්ෂේත්‍රයේ ද සම්මානයට පාත්‍ර වුණු ශිල්පිණියක් වෙනවා.

කුඩා පුතුව තුරුළේ තියාගෙන මේ කතා බහට සවන් දුන් තරුපතිගේ වාරයයි දැන්. ඔහු පුතුව ගයනි දුන්නා. තරුපති මුණසිංහ නම් වූ සම්මානනීය තරුණ සංගීතවේදියාණන් ගැන වෙනමම කියන්න ඕන නැහැ. "හඳුනාගන්නොත් ඔබ මා" නමින් ඉදිරිපත් කරපු ඔහුගේ "ගායනා" සංගීත කවයේ ප්‍රසංගයෙන් අප ඔහුව හඳුනාගන්නා.

"අරුන්දතී" නාට්‍යට සම්බන්ධ වෙනකොට අපේ තරුණ පිරිසක් හිටියා මේ දේවල් ගැන උනන්දුවක් තිබුණ. තුමිඳු තරංග, සම්පත්, විරාග, නඳුන් ලියනාරච්චි වගේ අය. ඉස්කෝල වෙනස් වුණත් අපි පාසල් කාලෙ මිතුයෝ හැටියටයි හිටියෙ. ඒක තමයි අපේ හඳුනාගැනීම. ඉතින් යොවන සම්මාන නාට්‍ය කරනවා, කෙටි නාට්‍ය කරනවා.... ඒ උනන්දුව තිබුණා ඇත්තටම. තුමිඳු තමයි යෝජනා කළේ මේ දේ කරමු කියලා.

"නාට්‍යයේ සින්දු පහක් තියෙනවා. හතරක්ම ලිව්වෙ මංජුල වෙඩිවර්ධන. අතික ලිව්වෙ තරංග දන්දෙණිය. මේ මම දෙවෙනියට වගේ කරපු වේදිකා නාට්‍ය. තාත්තා කරපු රතු හැට්ටකාරි වේදිකා නාට්‍ය සංගීතයෙන් ක්ෂේත්‍රයේ වෙනමම හඬක් ඇතිවුණා. මේ නාට්‍යටත් ඒ වාගේ නාට්‍යෝචිත සංගීතයක් අවශ්‍ය බව මට දැනුණා. තරුපති, දිවංගත ඔස්ටින් මුණසිංහ ප්‍රවීණ සංගීතවේදියාණන්ගේ එකම පුත්‍රයායි. ඔස්ටින් මුණසිංහයන් ගෙනේ සංගීතවත් වුණ වේදිකා නාට්‍ය ප්‍රේක්ෂකයින්ව දිනාගන්නේ ඒ සංගීත රටාවලින් කියලා කිව්වොත් නිවැරදියි.

"ඉතින් අරුන්දති නාට්‍යයේ සංගීතයට යොවන සම්මාන වගේම රාජ්‍ය සම්මානත් ලැබුණා. ඇත්තටම ඒ රාජ්‍ය නාට්‍ය උළෙලට ඉදිරිපත් වුණ අතික් නාට්‍යවල සංගීතය කරලා තිබුණේ රෝහණ වීරසිංහ, රසකාන්ත ගුණතිලක වගේ ප්‍රවීණයෝ. ඉතින් ඉස්කෝලෙන් පිටවුණ කොල්ලො විදියට මේක අපිට හරි වටිනා දෙයක් වුණා. මේ ප්‍රවීණයෝ අඳටත් ගුණවත් මිතුයො විදියට අපිට ආශිර්වාද කරනවා."

"අරුන්දතී" ට සම්මාන ලැබුණ උත්සවවල විනිශ්චය මණ්ඩලවල හිටියේ අශෝක හඳගම, ජයන්ත චන්ද්‍රසිරි වගේ වෙනම ධාරාවන් වල නිර්මාණ කරපු දැවැන්තයෝ. අපේ කාලයේ වීරයෝ. ඒ අය හැමෝම මේ නාට්‍යයේ තිබුණ සෞන්දර්ය ගුණය අගය කළා. ඇත්තටම හින්දි චිත්‍රපටියක් වගේ සුන්දර අත්දැකීමක් වුණ බවයි කිව්වෙ. ඒ හැඩය ගැන හැමෝම කතා කළා.

"එදා බැළුවටත් වඩා වෙනස් විදියකටයි හැමෝම දැන් මේ නිර්මාණය දිහා බලන්නෙ. මේ ළඟක් වෙනකලුත් ලංකාවේ රූපවාහිනී නාලිකාවල විටින් විට "අරුන්දතී" පෙන්නපු නිසා හුග දෙනෙක් මේ ගැන දන්නවා. මේ රඟපාන අයත් වෙන වෙන ටෙලි නාට්‍යවල, වේදිකා නාට්‍යවල, චිත්‍රපටිවල දකින අය බවට අද පත්වෙලා. ඉතින් ඒ අයගේ හපන්කම් ගැන වෙනම කියන්න දෙයක් නැති තරම්. මම මේ දේට වෙහෙස වුණේ බෙරික් පන්සල වෙනුවෙන්. කිසිම ආර්ථික වාසි බලාගෙන නෙවෙයි. මෙහෙ අයට හොඳ දෙයක් පෙන්වන්න තිබුණ ආශාව නිසයි."

"අපිට හරි සතුටුයි තරුලා ඕස්ට්‍රේලියාවේ ඉඳන් මේ වගේ අපේ හොඳ දේවල්වලට උනන්දුව වෙන එකට. ටිකක් දුකයි ඔයාලා අපෙන් ඈත්වෙලා ඉන්න එකට. අපේ දේවල් දකපු නැති අයට මේ දේවල් පෙන්වන්න උත්සාහ කරන එක මොන තරම් හොඳද ? ඔයාලගේ දරුවෝ වුණත් අපේ හොඳ දේවල් විඳින්න හුරුවෙච්චි. ජයනාත් අපගේ කතාබහට ආයෙත් එක් වුණේ හැඟීම් බරව.

"ජාත්‍යන්තර ප්‍රේක්ෂකාගාරයක නාට්‍යක් පෙන්වන එකයි අපේම අයගේ ප්‍රේක්ෂකාගාරයක නාට්‍යයක් පෙන්වන එකයි දෙකක්. ඉතින් මේ දෙකේම වැදගත් කමක් තියෙනවා. අපේ රට නියෝජනය තරමින් පිටරටවල්වල ඉන්න අපේම ලෙයින් මසින් හැදුන අපේ අය මුණගැහෙන්න ලැබෙන එක වාසනාවක්. ඉතින් අපි හරි ආසාවෙනුයි මේ වැඩේට එකතු වෙන්නෙ." ඒ ධර්මප්‍රිය.
"අපි හැදෙන්නෙ ප්‍රේක්ෂකයින්ගෙන්. අපේ අඩුපාඩු තියෙනවානම් කියන්න." ඒ ඉල්ලීම හෂිනිකාගෙන්.

අළුත් පරම්පරාවේ අපේ දේවල් දකින්න මේක හොඳ අවස්ථාවක්. ඉතින් අපි "අරුන්දතී" බලන්න එන්න කියලා ආදරයෙන් ආරාධනා කරනවා." තුමිඳු ආරාධනා කළා. අප ඔවුන්ට පාඩකයින් වෙනුවෙන් සුතුතිවන්ත වෙමින් සුභ පැතුවා

සාකච්ඡා කළේ
සිසිර දිසානායක

ජ්‍යෝතිෂය ASTROLOGY

කේන්ද්‍රය අනුව පලාපල කථනය, නැකැත් සෑදීම
කේන්ද්‍ර, ඇතුළු සියළු ජ්‍යෝතිෂ කටයුතු සඳහා
විමසන්න.

දේවසිරි විද්‍යාරත්න (M.A)
90777523 - 0450303527